# PAFFREL

**නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.**

**சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.**

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**


ගරු කථානායකතුමා, 2015.12.08

සභාපති,

ව්‍යවස්ථා දායක සභාව,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

ගරු සභාපතිතුමනි,

**ප්‍රථම වරට ස්ථාපිත කරන ලද කොමිෂන් සභා වලට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදනයන් පිළිබඳවයි.**

ඔබ කොමිෂන් සභාවේ නිර්දේශ මත මේ වන විට අප රටට අවශ්‍ය ස්වාධීන කොමිෂන් සභා රාශියක් ස්ථාපිත වී ඇත. ඒ පිළිබඳව ඔබතුමාටත් ව්‍යවස්ථා දායක සභාවේ සෙසු සාමාජිකයන්ටත් අපගේ ගෞරවනීය ප්‍රසාදය පළ කර සිටිමු.

එමෙන්ම ප්‍රථම වතාවට ස්ථාපිත වූ කොමිෂන් සභා ක්‍රියාත්මක වීමේදී නීතිමය ප්‍රතිපාදන වල ගැටළුකාරී තත්වයක් මතුවීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි ප්‍රයෝගික ගැටළු පැන නැගී ඇති බව දක්නට ලැබේ. එබැවින් ස්ථාපිත කරන ලද කොමිෂන් සභා ක්‍රියාත්මක වීමේදී එකී කොමිෂන් සභා වල අරමුණු අනුව ක්‍රියාත්මක වන්නේද යන්න සහ ක්‍රියාත්මක වීමේදී මුහුණු දෙන නීතිමය ගැටළු පිළිබඳවත් ඔබ කොමිෂන් සභාවේ අවධානය යොමු කළ හැකි නම් බෙහෙවින් කෘතඥ වෙමු.

මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස මැතිවරණ කොමිෂන් සභාවට අදාලව පහත සඳහන් කරුණු කෙරෙහි ඔබ කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

1. **ගණ පූර්ණය**

   කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනෙකු පමණක් සිටින බැවින් ගණ පූර්ණය දෙදෙනෙකු දක්වා අඩු කිරීම.

2. **සභාපතිවරයාගේ බලතල**

   මැතිවරණයකදී ඇති වන ප්‍රායෝගික තත්වයන් වලට විසඳුම් කඩිනමින් අවශ්‍ය වන බැවින් ඒ සඳහා යම් සීමාවකට/අනුමැතියකට යටත්ව සභාපතිවරයාට යම් තීන්දු ගැනීමේ බලතල ඇති කිරීම.

3. **කොමසාරිස් ජනරාල්වරයාගේ ධූරකාලය**

   කොමසාරිස් ජනරාල්වරයාගේ ධූරකාලය වයස අවුරුදු 65 දක්වා සඳහන්ව ඇතත් ඔහු පරිපාලන හා මූල්‍ය කටයුතු පාලනය කරන බැවින් ඔහු විශ්‍රාමිකයෙකු නොවිය යුතුය. එබැවින් ඔහුගේ ධූරකාලය වයස අවුරුදු 60 දක්වා අඩු කිරීම.

4. **කොමසාරිස් ජනරාල්වරයා පත්වීම.**

   ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනුව කොමිෂන් සභාව මගින් ඔබ කොමිෂමේ නිර්දේශ මත කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කළ යුතු වුවද කොමිෂම පත්වී මාසයකට වැඩි කාලයක් ගත වී ඇතත් කොමසාරිස් ජනරාල්වරයෙකු පත් වී නොමැත. මූල්‍ය සහ පරිපාලන ක්‍රියාවලිය මෙහෙය වීමට එම තනතුර අවශ්‍ය වන බැවින් එම තනතුරට පුද්ගලයෙකු පත් කිරීමට ක්‍රියාකරන ලෙසත් සම්ප්‍රදායක් ලෙස ඒ සඳහා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිළධාරියා හෝ නිළධාරීන්ගෙන් කෙනෙකු පත් කළ හොත් එය අනාගතය සඳහා හොඳ පූර්වාදර්ශයක් සපයනු ඇත.

මෙයට,

විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂක

පිටපත - කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින්ට


**# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.**

**Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443**

**E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk**